**පේදුරුතුඩුව ප්‍රාදේශීය සභාව**
**යාපනය දිස්ත්‍රික්කය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 28 දින විගණනය සඳහා ඉදිරිපත් කරන ලද අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දින ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපති වාර්තාව 2016 නොවැම්බර් 10 දින සභාවේ ලේකම් වෙත ඉදිරිපත් කරන ලදී.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ **1.3** ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශන වලින් පේදුරුතුඩුව ප්‍රාදේශීය සභාවේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගණකාධිකරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිමු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1 ගිණුම්කරණ දෝෂ

සභාව විසින් භාවිතා කරන වාහන 17 ක වටිනාකම, එම වාහනවල අයිතිය පවරා ගැනීමෙන් තොරව අගයා තිබුණි. එනමුත්, එම වටිනාකම ගිණුම්වලට ගෙන නොතිබුණු බැවින් මෝටර් රථ වටිනාකම ගිණුම්වලට ගෙන නොතිබුණු බැවින් අඩුවෙන් දක්වා තිබුණි.

### 1.3.2 ලැබිය යුතු මුදල් හා ගෙවිය යුතු මුදල්

(අ) රු.41,505 ක් වූ අත්තිකාරම් මේ දක්වා නිරවුල් කර නොතිබුණි.

(ආ) රු.186,771 ක් වූ ගෙවිය යුතු මුදල් අදාල පුද්ගලයන්ට හෝ ආයතනවලට නොගෙවා මේ දක්වා තැන්පත් ගිණුමේ තබා තිබුණි.

### 1.3.3 නීති, රීති සහ රෙගුලාසි ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති පරිච්ඡේදය II - රීති 5(XII) | මුදල් හා ගබඩා පිළිබඳ වගකිව යුතු නිලධාරීන්ගෙන් ආරක්ෂක ඇප මුදල් ලබාගෙන නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි<br>මුදල් රෙගුලාසි 571 | වසර දෙකකට වඩා පැරණි රු.1,191,648 ක් වූ රැඳවුම් මුදල් මිශ්‍ර තැන්පතු ගිණුමේ රඳවාගෙන තිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, ඉකුත් වර්ෂය සඳහා වූ රු.20,236,917 ක් වූ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම සමඟ සැසඳුවිට, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ සභාවේ අනුරූපී පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.21,255,713 ක් විය. කුලී ආදායම සහ රජයේ ප්‍රදාන වැඩිවීම රු.1,019,796 කින් මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට හේතුවිය.

### 2.2 කාරක ප්‍රාග්ධනය හා කළමනාකරණය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, ඉකුත් වර්ෂය සඳහා වූ රු.125,534,837 ක් වූ අනුරූපී කාරක ප්‍රාග්ධනය සමඟ සැසඳුවිට සමාලෝචිත වර්ෂය සඳහා වූ කාරක ප්‍රාග්ධනය රු.128,395,374 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂය සඳහා වූ කාරක ප්‍රාග්ධනයේ රු.2,850,337 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

### 2.3 ආදායම් කළමනාකරණය

#### 2.3.1 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

සමාලෝචිත වර්ෂය සඳහා වූ ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | 2015 | | 2015දෙසැම්බර්31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | ඇස්තමේන්තුගත | තථ්‍ය | රු’000 |
| | රු’000 | රු’000 | |
| වරිපනම් හා බදු | 617 | 84 | 916 |
| බදු කුලී | 8,032 | 4,996 | 120 |
| බලපත්‍ර ගාස්තු | 978 | 1,061 | - |
| අනෙකුත් ආදායම් | 59,174 | 48,554 | 62,539 |
| එකතුව | 68,801 | 54,695 | 63,575 |

**2.3.2 වරිපනම් සහ බදු**

රු.916,241 ක් වූ දේපල තක්සේරු බදු සමාලෝචිත වර්ෂය තුලදී අයකර නොතිබු අතර, යලි තක්සේරු කිරීමද සිදුකර නොතිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

වර්ෂ 2007 සිට වර්ෂ 2015 කාල පරිච්ඡේදය තුලදී, ප්‍රජා මධ්‍යස්ථාන වෙත පලාත් පාලන කොමසාරිස් විසින් පරිත්‍යාග කළ රු.539,613 ක් අදාල ප්‍රජා මධ්‍යස්ථාන වෙත නිකුත් කිරීමෙන් තොරව මිශ්‍ර තැන්පතු ගිණුමේ රඳවාගෙන තිබුණි.

**3.2 ව්‍යාපෘති ප්‍රමාද කිරීම්**

සමාලෝචිත වර්ෂය තුලදී අයවැය මඟින් අනුමත රු.1,235,000 ක් වටිනා ව්‍යාපෘති පහක් සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කර නොතිබුණි.

**3.3 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

සභාවේ විෂය පථයට වැටෙන ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතු ක්‍රියාත්මක කර නොතිබුණි.

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 අයවැය පාලනය**

අයවැය විධිමත්ව පිළියෙල කර නොතිබුණි. ඒ හේතුකොට ගෙන අයවැයගත වියදම හා තථ්‍ය වියදම අතර රු.38,400 සිට රු.14,339,419 දක්වා වූ පරාසයක විචලනයක් පැවතුණි.

**4.2 අභ්‍යන්තර විගණනය**

අභ්‍යන්තර විගණන කටයුතු සතුටුදායක අන්දමින් සිදුකර නොතිබුණි.

**4.3 විගණනය සහ කළමනාකරණ කමිටු රැස්වීම්**

සභාව විසින් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි.

**4.4 වත්කම් කළමනාකරණය**

**අක්‍රීය වත්කම්**

සමාලෝචිත වර්ෂය තුලදී වාහන 11 ක් අක්‍රීයව පැවතුණි.

**5. පද්ධති හා පාලන**

පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) වාහන ධාවන සටහන්

(ආ) තැන්පතු ලේඛණය

(ඇ) අත්තිකාරම් ලේඛණය